
# ලෝකය බළ කඳවුරුවල බෙදී යාමේදී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ක්‍රියාකාරිත්වය

එක්සත් ජාතීන්ගේ සංවිධාන ව්‍යුහය සහ එහි අනු ආයතන ගැන මෙහි 4 වැනි පාඩමේ දී දීර්ඝ ලෙස විස්තර කොට ඇති නිසා මෙහි දී සාකච්ඡා කරනු ලබන්නේ ලෝක සාමය සඳහා එක්සත් ජාතීන්ගේ දායකත්වය ගැන පමණි. එම තොරතුරු පහත සඳහන් ආකාරයට බෙදා වෙන් කරගෙන අධ්‍යයනය කළ හැකි ය.

1. සීතල යුද්ධය හෙවත් නිරවි යුද සමයේ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරිත්වය
2. නිරවි යුද්ධය අවසන් වූ පසු එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරිත්වය
3. නිරායුධකරණය ආදි වශයෙනි.

## නිරවි යුද සමයේ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරිත්වය



රූපය 5.5 එක්සත් ජාතීන්ගේ සාම හමුදාව

සීතල යුද්ධය හෙවත් නිරවි යුද්ධය ලෙස හඳුන්වන්නේ දෙවන ලෝක යුද්ධයෙන් පසුව ඉහත දැක්වූ ආකාරයට ලෝකය බළ කඳවුරු දෙකකට බෙදී අවි ආයුධ භාවිත නොකොට වුව ද තම කඳවුර ජයග්‍රාහී කරගැනීම සඳහා විවිධ උපක්‍රම යොදා ගනිමින් ගෙන ගිය සටන හෙවත් අරගලය යි.

දෙවන ලෝක යුද්ධයෙන් පසු දශක හතරක් යන තුරු ධනවාදී කඳවුර හා සමාජවාදී කඳවුර අතර පැවති බල තරගය හා බැඳුණු අන්‍යෝන්‍ය අවිශ්වාසය, මතවාදී ගැටුම, අන්‍යෝන්‍ය තර්ජනය, රහස් ඔත්තු සේවය යන අංග මෙම අරගලයේ ප්‍රධාන ලක්‍ෂණ

විය. මෙම සීතල හෙවත් නිරවි යුද සමයේ ලෝකයේ යම් යම් ස්ථානවල දී බළ කඳවුරු දෙක අතර ඇති වීමට ගිය අවි ගැටුම් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මැදිහත් වීමෙන් වළක්වා ගෙන ඇත. ඒ අතර,

1. බර්ලින් ප්‍රශ්නය
2. සූවස් අර්බුදය
3. කියුබානු මිසයිල අර්බුදය
4. කොරියානු ප්‍රශ්නය ආදිය වැදගත් වේ.

## බර්ලින් ප්‍රශ්නය

දෙවන ලෝක මහා සංග්‍රාමයට පසුව බර්ලිනය බටහිර හා නැගෙනහිර ලෙස කොටස් දෙකකට බෙදිණි. බටහිර බර්ලිනයට මූල්‍ය ප්‍රතිසංස්කරණ බටහිර රටවල් විසින් හඳුන්වා දෙන ලදී. මේ නිසා 1948 ජුනි 23 වැනි දින බටහිර බර්ලිනයට ඇතුළු වන සියලු ම මාර්ග වසා දැමීමට රුසියානු නායක ස්ටාර්ලින් පියවර ගත්තේ ය. වසරක් පමණ යන තුරු පැවති මේ ප්‍රශ්නය 1949 මැයි 04 වැනි දින එක්සත් ජාතීන්ගේ මහ ලේකම් විසින් සාකච්ඡා මඟින් විසඳන ලදී. මහා බලවතුන්ගේ බල තරගයේ එක් අවස්ථාවක් මෙසේ සමථයකට පත් විය.

## සූවස් අර්බුදය

මිසර ජනාධිපති අබ්දුල් ගමාල් නසාර් සමාජවාදී ආර්ථික ප්‍රතිපත්තිය අගයමින් සූවස් ඇල ජන සතු කෙළේ ය. ඒ නිසා එංගලන්ත හා ප්‍රංශ සමාගම් අපහසුතාවට පත් වීම නිසා ඊශ්‍රායල, බ්‍රිතාන්‍යය සහ ප්‍රංශ හමුදා සූවස් ප්‍රදේශය වෙත එවන ලදී. 1954 දී එක්සත් ජාතීන්ගේ හමුදා ඉවත් කොට සාමය ආරක්ෂා කරන ලදී.

## කියුබානු මිසයිල අර්බුදය

කියුබානු විප්ලවය අවස්ථාවේ එරටින් එක්සත් ජනපදයට පලාගිය පිරිස් එක්සත් ජනපදයේ යුද පුහුණුව ලැබ පිදෙල් කස්ත්‍රෝගේ සමාජවාදී රජයට එරෙහි ව ආයුධ සන්නද්ධ ව පැමිණියහ. මෙහි දී සිවිල් යුද තත්ත්වයක් ඇති විය. කැරලිකරුවන්ට එක්සත් ජනපදයේ ආධාර ලබා දුන් බැවින් එරටට පහර දිය හැකි මිසයිල රුසියාව විසින් 1962 ඔක්තෝබරයේ දී කියුබාවේ සවි කරන ලදී. මේ නිසා ජනාධිපති කෙනඩිගේ නියෝග මත කියුබාව වටලන ලද අතර රුසියාවට එල්ල කොට තුර්කියේ ද මිසයිල රඳවන ලදී. මෙම ගැටලුව එක්සත් ජාතීන්ගේ මහලේකම්ගේ පෞද්ගලික මැදිහත් වීමෙන් විසඳන ලදී.

## කොරියානු අර්බුදය

කොරියාව 1948 දී උතුරු හා දකුණු වශයෙන් කොටස් දෙකකට බෙදිණි. උතුරු කොරියාව රුසියාවට ද දකුණු කොරියාව එක්සත් ජනපදයට ද පක්ෂ විය. අක්ෂාංශ 38 රේඛාව දෙරටේ දේශ සීමාව ලෙස පිළිගත් නමුත් 1950 ජුනි 25 වැනි දින උතුරු කොරියානු හමුදා දකුණු කොරියාව ආක්‍රමණය කළේය. දකුණු කොරියාවට එක්සත් ජනපද හමුදා යැවිණි. ආරක්ෂක මණ්ඩලය උතුරු කොරියාව සම්බන්ධයෙන් ඉදිරිපත් කළ යෝජනාව චීනය හා රුසියාව විසින් ප්‍රතික්ෂේප කරන ලදී. 1953 දී දෙරට අතර සාම සාකච්ඡා ආරම්භ වුව ද එය අසාර්ථක විය. 1991 දෙසැම්බර් 13 වැනි දින නැවත සාම ගිවිසුමක් ඇති විය. ඒ දක්වා දේශ සීමා නිරීක්ෂණ කටයුතු එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය මඟින් කරන ලදී. මෙම අර්බුදයේ දී චීනය හා රුසියාව උතුරු කොරියාවට ද එක්සත් ජනපදය දකුණු කොරියාවට ද සහාය වූහ.

## නිරවි යුද්ධය අවසන් වූ පසු එක්සත් ජාතීන්ගේ සාම මෙහෙයුම්

සෝවියට් රුසියාව බිඳ වැටීමෙන් පසු බල කඳවුරු දෙකේ තරගය අවසන් වුව ද යුද ගැටුම් තැන තැන පැවතිණි. ඒවා සමථයකට පත් කිරීමට වර්තමානයේ ද එක්සත් ජාතීන්ගේ සංවිධානය කටයුතු කරමින් සිටියි. නිරවි යුද්ධයෙන් පසු එක්සත් ජාතීන්ගේ සංවිධානය සිදු කළ සාම සාධක මෙහෙයුම් ලෙස

- ගල්ෆ් අර්බුදය
- කාම්බෝජ ප්‍රශ්නය
- රුවන්ඩාවේ ගැටුම්, යනාදිය දැක්විය හැකි ය.

## ගල්ෆ් අර්බුදය

මේ අර්බුදයට හේතු වූයේ ඉරාක දේශ සීමාවේ පිහිටි රුමෙයිලා තෙල් නිධියෙන් කුවේටය තෙල් සොරකම් කෙළේ ය යන චෝදනාව යි. මේ නිසා ඉරාකය විසින් කුවේටය ආක්‍රමණය කරන ලදී. මෙහි දී සෝවියට් රුසියාව බිඳ වැටීම නිසා බලවත් ව සිටි එක්සත් ජනපදය විසින් ඉරාකයට එරෙහි ව හමුදා එවන ලදී. "එක් රටකට තවත් රටක් ආක්‍රමණය කිරීමට ඉඩ දිය නොහැකි ය. එසේ කිරීමේ දී නිහඬ ව බලා සිටී නම් එය ඊට අනුබල දීමකි" යනුවෙන් එවකට ඇමරිකානු ජනාධිපති ජෝර්ජ් ඩබ්ලිව් බුෂ් ප්‍රකාශ කෙළේ ය.

දෙවන ලෝක යුද්ධයට පමණක් දෙවැනි වූ මෙම යුද්ධය නිසා විශාල ජීවිත හා දේපල හානියක් මෙන් ම පරිසර දූෂණයක් ද සිදු විය. එක්සත් ජාතීන්ගේ සංවිධානයට එම ගැටුම වළක්වා ගත නොහැකි විය.

## කම්පුචියානු හෙවත් කාම්බෝජ අර්බුදය

1970 වන විට වසර 30 පමණ කාලයක් කාම්බෝජය තුළ විවිධ කැරලි කාර සංවිධාන හා සිහනුක් කුමරුගේ රජය අතර ගැටුම් ඇති විය. සිහනුක් කුමරු නාමමාත්‍රික පාලකයා වූ අතර පොල්පොට් නම් ආඥාදායකයා පැසිස්ට්වාදී පාලනයක් ගෙන ගියේ ය. මේ තත්ත්වය සමනය කිරීමට 1985 දී එක්සත් ජාතීන්ගේ මහ ලේකම් බූටෝස් ගාලි කාම්බෝජයට ගොස් සියලු පාර්ශ්වයන් සමඟ සාකච්ඡා කෙළේ ය. ඉන් පසු 1989 දී වියට්නාම හමුදා කාම්බෝජයෙන් ඉවත් විය.

1993 දී එක්සත් ජාතීන්ගේ මූලිකත්වයෙන් නිදහස් මැතිවරණයක් පැවැත්වූ අතර 1993 දෙසැම්බරයේ දී එම සංවිධානයේ මැදිහත් වීම ද අවසන් කරන ලදී.

## රුවන්ඩා අර්බුදය

1990 වසරේ සිට රුවන්ඩා රජයේ හමුදා සහ රුවන්ඩා දේශානුරාගී පෙරමුණ අතර සටන් ඇති විය. 1993 දී දෙපිරිස අතර සාමයක් ඇති වුව ද 1994 අප්‍රේල් 6 වැනි දින රුවන්ඩා හා බුරුන්දි ජනාධිපතිවරුන් ගුවන් අනතුරකින් මිය යාමත් සමඟ නැවත සටන් ඇති විය. 1994 දී එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවක් ගොස් තත්ත්වය පාලනය කර පැමිණි පසු නැවත රුවන්ඩාවේ හුටු හා ටුට්සි ගෝත්‍ර අතර සටන් ඇති විය. මේ තත්ත්වය ද එක්සත් ජාතීන්ගේ මැදිහත්වීමෙන් පාලනය කරන ලදී.

### ශිෂ්‍ය ක්‍රියාකාරකම

එක්සත් ජාතීන්ගේ සාමසාධක වැඩ සටහන් දියත් වූ රටවල ලේඛනයක් පිළියෙළ කරන්න. ඒ ඒ රටෙහි ඇති වූ ගැටුම කුමක් ද යන වග ලේඛනයට ඇතුළු කරන්න.



රූපය 5.6 මිසයිලයක්

## ලෝක ආර්ථිකය පාලනය


සීතල යුද්ධය අවසන් වූ 1980 දශකය තුළ රුසියාව බිඳ වැටී ධනවාදී කඳවුර පමණක් ඉතිරි විය. දෙවන ලෝක යුද්ධයෙන් පසු ව කඳවුරු දෙකෙහි බල තරගයක් පැවති බව පැහැදිලි ව දක්නට තිබිණි. එහි දී ඇමෙරිකා එක්සත් ජනපදය ධනවාදී ආර්ථික රටාව ව්‍යාප්ත කිරීමට කටයුතු කෙළේ ය. ඒ සඳහා 1949 ටෲමන් ජනාධිපතිවරයා "සිවු වැදෑරුම් වැඩ පිළිවෙළ" ක්‍රියාත්මක කරමින්, සංවර්ධනය වන රටවලට ආර්ථික ආධාර ලබා දී, තම බළ කඳවුරට එම රාජ්‍යයන් පක්ෂපාතී කොට ගැනීමට උත්සාහ දැරී ය. 1948 ක්‍රියාත්මක කළ මාෂල් සැලැස්මෙන් බලාපොරොත්තු වූයේ ද එය යි. නේටෝ (NATO) සංවිධානය පිහිටුවා ගැනීම ද එම අරමුණ ඉටුකර ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ගයකි. එසේ ම එක්සත් ජනපදය දිළිඳු රටවලට තිරිඟු, බිස්කට් ආදි ආහාර ආධාර ද ලබා දුනි. උදාහරණ PL 480 ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවට තිරිඟු පිටි සහන මිලට ලබා දීම හා 1980 දශකය දක්වා ශ්‍රී ලංකාවේ පාසල් දරුවන්ට දිවා ආහාරය සඳහා පෝෂ්‍යදායී බිස්කට් සැපයීම දැක්විය හැකි ය.

රුසියාව සමාජවාදී ආර්ථිකය හා කොමියුනිස්ට් පාලනය නැංවීමට කටයුතු කෙළේ ය. චීනය, උතුරු කොරියාව, කියුබාව, වියට්නාමය සහ නැගෙනහිර යුරෝපා රටවලට ද ප්‍රධාන වශයෙන් ආධාර ලබා දුන් අතර, සංවර්ධනය වන ආසියා අප්‍රිකා මහාද්වීපවල රටවලට ආර්ථික, තාක්ෂණික, අධ්‍යාපන හා සංස්කෘතික ආධාර ලබා දෙන ලදී. උදාහරණ වශයෙන් ශ්‍රී ලංකාවට කැලණි ටයර් සංස්ථාව ලබා දුන්නේ රුසියාව විසිනි. එමෙන් ම ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වන රටවල විද්‍යාර්ථීන්ට රුසියාවේ පැට්‍රිස් ලුමුම්බා මිත්‍රත්ව සරසවිය වැනි අධ්‍යාපනික ආයතනවලට ඇතුළු වීමට අවස්ථාව ලබා දීම සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය වාර්ෂික ව සිදු විය. ඒ, ඒ රටවල භාෂාවෙන් ම රුසියානු දේශපාලනය, සාහිත්‍යය සහ වෙනත් පුවත් ඇතුළත් කෘති මුද්‍රණය කර සහන මිලට ලබා දෙන ලදී. මේවායින් බලාපොරොත්තු වූයේ එම රටවල සමාජවාදී චින්තනය ව්‍යාප්ත කිරීම යි.

ලොව පුරා බොහෝ රටවල් 1950 දශකය වන විට සමාජවාදී රටාව අනුගමනය කරමින් ජනසතු ව්‍යාපාර බිහිකරනු දැකිය හැකි ය. ඒ වන විට පැවති බහුජාතික සමාගම් ඉවත් කිරීම එහි අරමුණ විය. උදාහරණ වශයෙන් මිසරය සූවස් ඇල ජනසතු කිරීම ලංකාවේ ගෑස් හා ඛනිජ තෙල් ජනසතු කිරීම, වරාය ජනසතු කිරීම දැක්විය හැකි ය.

මේ ආකාරයෙන් ලෝක බලවතුන් තම දේශපාලන හා ආර්ථික දර්ශන ඉදිරියට ගෙන යාමට උත්සාහ දරා ඇත.

# නොබැඳි ජාතීන්ගේ සමුළුව



රූපය 5.7 ජවහල්ර්ලාල් නේරුතුමා

දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් පසු එක්සත් ජනපදය ප්‍රමුඛ ධනවාදී කඳවුරත් රුසියාව ප්‍රමුඛ සමාජවාදී කඳවුරත් තම දේශපාලන හා ආර්ථික දර්ශන ඉදිරියට ගෙන යාමේ දී ලොව සෙසු රටවල් ද ඊට ඇඳා ගැනීමට ප්‍රබල උත්සාහයක් දරා ඇත. මේ අවධිය වන විට බොහෝ අප්‍රිකා-ආසියානු රටවල් යටත් විජිත තත්ත්වයෙන් මිදී ස්වාධීනත්වය ලබමින් සිටියහ. එම රටවල සමාජ ආර්ථික තත්ත්වය ගොඩ නැංවීමට ආධාර ලබා දීමට ද මෙම බළ කඳවුරු ඉදිරිපත් වූහ. එහි දී ආධාර ලබා දෙන පක්ෂයට සෘජු ව හෝ වක්‍ර ව පක්ෂ පාතී වීමට සිදු වීම මේ රටවල ස්වාධීනතාවට ගැටලුවක් විය.

මේ නිසා ජාතීන්ගේ ස්වාධීනතාව ආරක්ෂා කොට ගැනීම, සමාජ ආර්ථික ශුභ සිද්ධිය උදා කර ගැනීම, ජාතීන් අතර මිත්‍රත්වය, සාමකාමී සහජීවනය සුරක්ෂිතකොට ගැනීම යනාදිය අරමුණු කොට ගෙන බළ කඳවුරු භේදය නො සලකා නොබැඳි ජාතීන්ගේ සංවිධානය පිහිටුවා ගන්නට යෙදිණි.

1954 දී කොළඹ හා 1955 ඉන්දුනීසියාවේ බැංඩුං නුවර පැවති රාජ්‍ය නායක සම්මේලනවල දී මේ අදහස සාකච්ඡාවට භාජනය වී ඇත. එහි දී ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රීමත් නේරු විසින් ඉදිරිපත් කළ පස්වැදෑරුම් (පංචශීල) ප්‍රතිපත්තිය මත 1961 සැප්තැම්බර් 1 වැනි දින යුගෝස්ලවියාවේ බෙල්ග්‍රේඩ් නුවර දී ප්‍රථම සැසි වාරය පවත්වන්නට යෙදිණි. එයට ශ්‍රී ලංකාව, ඉන්දියාව, යුගෝස්ලාවියාව, ඊජිප්තුව, ඉන්දුනීසියාව යන රටවල රාජ්‍ය නායකයෝ සහභාගි වූහ. නොබැඳි සම්මේලනයට පදනම් වූ පස්වැදෑරුම් (පංචශීල) ප්‍රතිපත්තිය මෙසේ ය.

1. සැම රටක ම ස්වාධීනතාවයට හා ඒකාග්‍රතාවට අන්‍යොන්‍ය වශයෙන් ගරු කිරීම
2. කිසිදු ජාතියක් තවත් ජාතියක් ආක්‍රමණය නො කිරීම
3. කිසිදු රටක අභ්‍යන්තර කාර්යයන්ට බලපෑම් නො කිරීම
4. සාමකාමී සහජීවනය
5. සමානතාව හා අන්‍යොන්‍ය සුබ සිද්ධිය

1961 බෙල්ග්‍රේඩ් සම්මේලනයට රටවල් 45ක් ද, 1964 කයිරෝ සමුළුවට රටවල් 47ක් ද, 1970 ලුසාකා සමුළුවට රටවල් 53ක් ද, 1973 ඇල්ජීරියන් සම්මේලනයට රටවල් 75ක් ද, 1976 කොළඹ සමුළුවට රටවල් 85ක් ද, සහභාගි වූහ.

**ශිෂ්‍ය ක්‍රියාකාරකම**

"බළ කඳවුරු දෙකක් පවතිද්දී නොබැඳි ප්‍රතිපත්තියක ඇති අගය", යන මැයෙන් රචනයක් ලියන්න.

## සෝවියට් රුසියාව බිඳ වැටීම

ආසියා- යුරෝපා මහාද්වීප දෙකෙහි විශාල බිම් ප්‍රදේශයක් ආවරණය වන පරිදි ව්‍යාප්ත ව පැවති සෝවියට් රුසියාව පාලනය වූයේ දැඩි පාලන ක්‍රමයක් තුළිනි. පසු කාලය වන විට එතරම් සුවිශාල භූමියක් පාලනය කිරීම අපහසු විය. ඒ සඳහා සුදුසු දේශපාලනමය යාන්ත්‍රණයක් පැවතිය ද කාර්මික, කෘෂිකාර්මික යන සෑම අංශයක ම පාලනය මෙහෙය වීම දුර්වල වීම නිසා ආර්ථික හා දේශපාලන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට සිදු විය. ඒ අනුව එතෙක් පැවති සමාජවාදී ප්‍රතිපත්ති වෙනුවට 1980 දශකයේ අග භාගය වන විට එවක රුසියානු ජනාධිපති ව සිටි මිහායිල් ගොර්බචොෆ් විසින් "පෙරස්ත්‍රොයිකා, සහ "ග්ලාස්නොට්ස්, නම් ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන ලදී. එම ප්‍රතිපත්ති තව දුරටත් ක්‍රියාත්මක කිරීම ගොර්බචොෆ්ගේ අනුගාමිකයා වූ යෙල්ට්සිං විසින් ද සිදු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස රුසියාව සමාජවාදී ක්‍රමයෙන් ඉවත් ව නිදහස් ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කරන රටක් බවට පත් විය. එම ප්‍රතිසංස්කරණවලට තුඩු දුන් හේතු මෙහි දී විමසා බලමු.

1. නිලධාරිවාදය සහ එම ක්‍රමයේ පැවති අඩුපාඩු
2. සමාජවාදී ආර්ථික ප්‍රතිපත්ති නිසා තරගකාරී නිෂ්පාදන බිහි නොවීම
3. සමාජවාදී ආර්ථික ප්‍රතිපත්ති නිසා නව නිෂ්පාදන බිහි නොවීම හා තරගකාරී මිල ගණන් නො තිබීම
4. වෙළෙඳපොළ අවශ්‍යතා හඳුනා නොගෙන නිෂ්පාදන සිදු කිරීම
5. අවශ්‍ය ප්‍රමාණයටත් වඩා දෛනික ව නිෂ්පාදන සිදු කොට ගබඩා කොට තැබීම
6. එම නිෂ්පාදන ක්‍රියාවලියේ දී සිදු වන පාඩු රජයට විඳ ගැනීමට සිදු වීම
7. අධික යුද වියදම
8. සමාජවාදය ව්‍යාප්ත කිරීමට කළ අධික වියදම
9. නිදහස් ආර්ථිකය පිළිබඳ නව පරපුර තුළ තිබූ අපේක්ෂාවන්
10. එක්සත් ජනපද රහස් ඔත්තු සේවා ක්‍රියාකාරිත්වය

## සෝවියට් රුසියාව බිඳවැටීමෙන් ඇති වූ ප්‍රතිඵල

සෝවියට් දේශය බිඳ වැටීමෙන් පසු ව ඇති වූ ප්‍රතිඵල ජාත්‍යන්තර හා ජාතික වශයෙන් විමසා බැලිය හැකි ය.

### ■ ජාත්‍යන්තර ප්‍රතිඵල

1. සමාජවාදී බළ කඳවුර බිඳ වැටිණි.
2. ධනවාදී කඳවුරේ නායකත්වය දැරූ එක්සත් ජනපදය ලෝක කටයුතුවල නිතරග නායකත්වයට පත් විය.
3. සමාජවාදී ක්‍රමය ව්‍යාප්ත වීමට තිබූ ඉඩ ප්‍රස්තා අවම විය.

4. න්‍යෂ්ටික තාක්ෂණය වෙනත් රටවලට ලබා දුනි. උදා :- ඉන්දියාව, ඉරානය, උතුරු කොරියාව
5. සීතල යුද්ධය හෙවත් කඳවුරු දෙකේ බල තරගය අවසන් විය.
6. අවි තරගය අහෝසි වීමට මග පෑදී ය.
7. වෝර්සෝ සංවිධානය විසුරුවා හැරී ය.

■ **ජාතික වශයෙන් ඇති වූ ප්‍රතිඵල**

1. සමාජවාදී පාලනය වෙනුවට රුසියාවේ බහුපක්ෂ ක්‍රමයක් සහිත ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ස්ථාපිත වීම.
2. සමාජවාදී ආර්ථිකය වෙනුවට ධනවාදී නිදහස් ආර්ථික ප්‍රතිපත්ති ආරම්භ කිරීම.
3. රාජ්‍ය ව්‍යවසායයන් වෙනුවට පෞද්ගලික ව්‍යවසායන් ඇති වීම.
4. ආනයන අපනයන සීමා අහෝසි වීම.
5. එක්වර ම ආනයන ගලා ඒම වැඩිවීම නිසා උද්ධමනය ශීඝ්‍රයෙන් ඉහළ යාම.
6. විදේශ ණය ලබා ගැනීම.

සෝවියට් දේශයට නව ආර්ථික ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමත් සමඟ උද්දාමයට පත් පිරිස්, සමාජවාදය පිළිකුල් කොට ලෙනින්ගේ පිළිරූ පවා කඩා විනාශ කළේ ය. ලෙනින්ග්‍රෑඩ් චතුරස්‍රය නැවත පීටර්ස්බර්ග් චතුරස්‍රය ලෙස පැරණි නාමයෙන් හැඳින් විය. එහෙත් රටේ ඇති වූ දැඩි ආර්ථික කඩා වැටීම, උද්ධමනය ඉහළ යාම, ආහාර හිඟය, විරැකියාව වැනි හේතු නිසා 1990 දශකය අවසන් වන විට "නැවත සමාජවාදී ක්‍රමය ඇති කළ යුතු ය." යන මතය රුසියාව පුරා පැතිරී ගියේ ය. ඒ අනුව ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට මුල් වූ බොරිස් යෙල්ට් සිං වෙනුවට ඊළඟ මැතිවරණවල දී, සමාජවාදය අගය කළ සමාජවාදී පක්ෂයේ නියෝජිත ව්ලැදිමීර් පූටින් ජනාධිපති ලෙස පත් විය. බෙලෝරුසියාව ප්‍රමුඛ වෙන් ව ගිය සමූහාණ්ඩු තුනක් නැවත එක් වී වර්තමාන රුසියාව බිහි කොට ගෙන ඇත.

සෝවියට් දේශය බිඳ වැටීම නිසා යුගෝස්ලෝවියාව, පෝලන්තය වැනි රටවල් නැවත කොටස්වලට බෙදී ගිය අතර නැගෙනහිර ජර්මනිය බටහිර ජර්මනිය සමඟ ඒකාබද්ධ විය. නැගෙනහිර යුරෝපා රටවල් බොහෝමයක් ද සමාජවාදී ක්‍රමයෙන් ඉවත් ව ධනවාදී ආර්ථික ක්‍රමය හා ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ප්‍රවාහයට එක් වූයේ, රුසියානු ආධාර නොලැබී යාම නිසා ය. මේ අනුව ලෝකය තුළ සමාජවාදී අදහස් ව්‍යාප්තිය සීමා වීමට රුසියාව බිඳවැටීම ප්‍රබල සාධකයක් ව ඇත.

## ජපානයේ නැඟී සිටීම

දෙවන ලෝක යුද්ධයෙන් පසු ව ලෝක බලවතකුගේ තත්ත්වයට නැඟී සිටි ප්‍රධානතම ආසියාතික රාජ්‍යය ජපානය යි. හිරෝෂිමා නාගසාකි විනාශයෙන් පසු මාෂල් සැලැස්ම ද උපයෝගී කොට ගෙන ජපානය නැවත නැඟී සිටි ආකාරය මෙහි දී විමසා බලමු. දෙවන ලෝක මහා සංග්‍රාමය වන විට ජපානයට කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය,

ඛනිජ තෙල් හා ගල් අඟුරු ද ජනතාවට අවශ්‍ය ආහාර ද මුළුමනින් ම ආනයනය කිරීමට සිදු වූයේ ජපානයේ ස්වාභාවික සම්පත් හිඟය හේතුවෙනි. යුද්ධය නිසා සියලු ම කර්මාන්ත පිරිහී තිබූ අතර ඔවුන් යුද්ධ අවස්ථාවේ දී අත්පත් කොට ගත් රාජ්‍යයන් ආපසු දීමට ද සිදු විය. ජපන් රාජ්‍යයට එරට දේශ සීමාවලට පමණක් සීමා වීමට සිදු විය.



රූපය 5.8 පූජියාමා ගිනි කන්ද

## එක්සත් ජනපද හමුදාවන් ජපානයට පිවිසීම

යුද්ධය පරාජය වීමත් සමඟ ඩග්ලස් මැක් ආතර් සෙනෙවියාගේ නායකත්වයෙන් යුතු එක්සත් ජනපද හමුදාවක් ජපානයට පිවිසියේ ය. ඔවුන්ගේ ප්‍රධාන අරමුණු දෙකකි. එනම්, ජපානයේ යුද ශක්තිය අඩු කිරීම සහ ජපානයට නව ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක් හඳුන්වා දීම යි.

මෙහි දී අපගේ අධ්‍යයනයේ පහසුව පිණිස ජපානය අත්කර ගත් දියුණුව දේශපාලන, ආර්ථික, සමාජ, සංස්කෘතික යනාදී අංශ යටතේ සාකච්ඡා කරමු.

''ජපන් ජනතාව වන අපි සැමදා සාමයට රිසි වෙමු.... සාමය ආරක්ෂා කිරීමට සහ කෲර පාලනයත් , වහල් භාවයත් , මහජන පීඩනය හා නොඉවසිලි බවත් මිහිතලයෙන් තුරන් කිරීමට වෙහෙස ගන්නා ජාත්‍යන්තර සමාජයක , ගරු කටයුතු තැනක් අත් කොට ගැනීමට අපි මනා කැමැත්තකින් යුතු වෙමු.''

ජපන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව. (පූර්විකාව)

## දේශපාලන ප්‍රගතිය

ප්‍රජාතන්ත්‍රවාදී හා සාමකාමී ආණ්ඩුවක් බිහි කිරීම සඳහා 1946 දී මැක් ආතර් සෙනවියාගේ අධීක්ෂණය යටතේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කොට එය 1947 මැයි 03 වැනි දින සිට ක්‍රියාත්මක කරන ලදී. එමඟින් ජපන් ජනතාව සාමය හා ප්‍රජාතන්ත්‍රවාදය යන උසස් පරමාර්ථ ආරක්ෂා කිරීමට බැඳුණහ.

දෙවන ලෝක සංග්‍රාමයට පෙර ජපාන අධිරාජයාට ජනතාවගේ පරමාධිපති බලය පැවරී තිබුණ අතර නව ව්‍යවස්ථාවෙන් අධිරාජයා රාජ්‍යයේත්, මහජන එක්සත් බවේත්

සංකේතය පමණක් විය. පරමාධිපති බලය සම්බන්ධයෙන් කිසි ම බලයක් අධිරාජයාට පැවරී නැත. අගමැති පත් කිරීම ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් පත් කිරීම වැනි ව්‍යවස්ථාවෙන් නියම කොට ඇති සීමිත කටයුතු කීපයක් පමණක් අධිරාජයාට පැවරී ඇත. අගමැතිවරයා ඩයට් නමින් හැඳින්වෙන ව්‍යවස්ථාදායක සභාවෙන් ද විනිශ්චයකාරවරු කැබිනට් මණ්ඩලයෙන් ද නම් කළ පසු අධිරාජයා විසින් පත් කිරීම් පමණක් සිදු කරනු ලැබිණි.



රූපය 5.9 ජපන් රජ මාළිගාව

## ඩයට් සභාව (ව්‍යවස්ථාදායකය)



රූපය 5.10 ඩයට් සභාව

1947 මැක් ආතර්ගේ ව්‍යවස්ථාව අනුව පිහිටු වූ පාර්ලිමේන්තුව ''ඩයට් සභාව'' නමින් හැඳින්වේ. එය ආසන 486කින් යුතු නියෝජිත මන්ත්‍රී මණ්ඩලයකින් හා ආසන 250කින් යුතු අනුශාසක මන්ත්‍රී මණ්ඩලයකින් ද සමන්විත ය. ඡන්ද කොට්ඨාශ 123කින් එකක් හැර සෙසු සියල්ල බහු ආසන වන අතර ඒවායින් මන්ත්‍රීවරු 2ත් 5ත් අතර සංඛ්‍යාවක් බැගින් තෝරා ගනු ලැබේ. නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ කාලය වසර හතරකි. අනුශාසක මණ්ඩලයේ කාලය වසර හයකි. වසර තුනකට වරක් 50%ක් බැගින් නැවත තෝරාගනු ලැබේ. වයස අවුරුදු 20ට වැඩි සැමට ඡන්ද බලය හිමි ය. පක්ෂ දේශපාලන ක්‍රමය ක්‍රියාත්මක වේ. සියලු නීති වලංගු නීති බවට පත් වීම සඳහා ඩයට් සභාවේ දී සම්මත කොට ගැනීමෙන් පසුව අධිරාජයාගේ අත්සන ලබා ගත යුතු වේ.

## විධායකය

සියලු විධායක බලතල අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයට පැවරී ඇත. අමාත්‍යවරුන් ප්‍රමාණය 18කට නොවැඩි විය යුතු ය. ඔවුන් සියලු දෙනා ඩයට් සභාවට සාමූහික ව වග කිව යුතු ය. ඇමතිවරුන් පත් කිරීම ඉවත් කිරීම, අගමැති සතු වගකීමකි. වර්තමානයේ දී අග්‍රාමාත්‍ය කාර්යාලය යටතේ අමාත්‍යාංශ 12 ක් හා ඒජන්සි 05 ක් ද ස්වාධීන විගණක මණ්ඩලයක් ද ඇත.